කොවිඩ්-19 ආසාදිත පුද්ගලයින්ව කොන් කරනා ආකාරයේ වාර්තාකරණයන් කොවිඩ්-19 පළමු සහ දෙවන රැල්ල සමගින් බහුලව දක්නට ලැබිණි. කෙසේ වෙතත් එම නැඹුරුතාව අඩුවී තිබුණත්, තවමත් විටින් විට මාධ්‍ය තුළ කොවිඩ්-19 ආසාදිතයින්ව කොන් කෙරෙනා ආකාරයේ වාර්තාකරණයන් දක්නට ලැබේ. අරුණ (04/01) පුවත්පතේ "කොවිඩ් ගුරුවරයා නිසා කොළඹ ආනන්දේ 7,8 ශ්‍රේණි නිවාඩු" යන සිරස්තලය සමගින් පළවූ පුවත ඊට උදාහරණයකි.

යම් පුද්ගලයෙකු කොවිඩ්-19 ආසාදිතයෙකු වීම එම පුද්ගලයාගේ වරදක් නොවේ. කොවිඩ්-19 වාර්තාකරණය සම්බන්ධයෙන් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය මගින් නිකුත් කොට ඇති නිර්දේශයන්හිද, 'වෛරසය ආසාදිත පුද්ගලයින් "රෝගීන්" මිස අනෙක් අයට "රෝගය පතුරුවන්නන්" ලෙසින් හැඳින්වීමෙන් වලකින' ලෙසින් සඳහන් වේ.

එවැනි පසුතලයක සිදුකෙරෙනා මෙවැනි වාර්තා කිරීම් මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනය කරනා බව පැවසීමට සිදුවේ.

එසේම, කොවිඩ්-19 ආසාදිත පුද්ගලයෙකු "කොවිඩ් ගුරුවරයා" ලෙසින් හැඳින්වීම කෙතරම් ජනමාධ්‍ය ආචාර ධර්ම හෝ ශික්ෂිත ලෝකයේ සදාචාරාත්මක අගයන් සමගින් සැසඳේද යන්නද පාඨකයන් ලෙසින් අප ප්‍රශ්න කළ යුතුවේ.

#MediaEthicsSL #lka #SinhalaPress #Aruna